# <u>සති පාසල සඳහා කාර්ය පත්‍රිකාව</u>

1. *පංතිය - 13
   *විෂය - ගිණුම්කරණය
   *අදාළ සතිය - දෙසැම්බර් 3

2. පාඩම හෝ ඒකකය - 13.0 අනුපාත මගින් මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය හා අර්ථකථනය කර කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරයි.
   නිපුණතා මට්ටම 13.5 - ක්‍රියාකාරී අනුපාත ගණනය කර අර්ථකථනය කරයි.

3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්-

   1. ක්‍රියාකාරී අනුපාත පිළිබඳ ව ඔබ දන්නා කරුණු මතකයට ගන්න.
   2. ක්‍රියාකාරී අනුපාත ගණනය කිරීම වැදගත් වන ආකාරය විමසා බලන්න.
   3.ඊ තක්සලාව,ඊ නැණපියස,ගුරු ගෙදර,DP Education හෝ පාසල් වෙබ් අඩවි හෝ මුද්‍රිත පොත්පත් ආදී ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්,පාඩම් ලබා ගෙන ඉගෙන ගන්න.
   4. ක්‍රියාකාරී අනුපාත වර්ග පිළිබඳව පොතපතින් කරුණු රැස් කරගන්න.
   5.තොග පිරිවැටුම් අනුපාතය ගණනය කරන්නේ කෙසේදැයි වැඩිහිටියන් සමඟ සාකච්ඡා කරන්න.

4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්,web site,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

   1. ඊ තක්සලාව - https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/resource/view.php?id=21433

   2. ඊ නැණපියස - https://www.enenapiyasa.lk/lms/mod/resource/view.php?id=13795
      https://www.enenapiyasa.lk/lms/mod/resource/view.php?id=16334

   3. ගුරු ගෙදර - නැත

   4. වෙනත් - යූ ටියුබ් -

https://www.youtube.com/watch?v=TdUx9ROlbdw
https://www.youtube.com/watch?v=I-bc39D_8ww

5. අතිරේක පොත්/සඟරා -

6. මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල -
    1. ක්‍රියාකාරී අනුපාත පැහැදිලි කරයි.
    2. ක්‍රියාකාරී අනුපාත නම් කර පැහැදිලි කරයි.
    3. තොග පිරිවැටුම් අනුපාතය ගණනය කරයි.
    4. තොග රැඳවුම් කාලය ගණනය කරයි.
    5. ණයගැති පිරිවැටුම් අනුපාතය ගණනය කරයි.
    6. ණය එකතු කිරීමේ කාලය ගණනය කරයි.
    7. අනුපාත සැසඳීමෙන් තීරණ ගනියි.

7. තක්සේරුව හා ඇගයීම -

1. ක්‍රියාකාරී අනුපාත මගින් ලබා ගත හැකි ප්‍රයෝජන මොනවාද?

2. හංසනී සමාගමේ වර්ෂ දෙකක් සඳහා ගණනය කරන ලද අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2020 | 2019 |
|---|---|---|
| තොග රැඳවුම් අනුපාතය (වාර) | 18 | 15 |
| තොග රැඳවුම් කාලය (දින) | 20 | 24 |
| ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර) | 10 | 12 |
| ණය එකතු කිරීමේ කාලය (දින) | 36 | 30 |

ඉහත තොරතුරු අධ්‍යයනය කිරීමෙන්,

- තොග අලෙවිය වඩාත් කාර්යක්ෂම වර්ෂය
- ණය එකතු කිරීමේ කාලය කාර්යක්ෂම ව සිදු වූ වර්ෂය
- ක්‍රියාකාරීත්වය අතින් වඩාත් කාර්යක්ෂම ගිණුම් වර්ෂය

නිලධාරියාගේ නම -
පාසල/පිරිවෙන -